# අම්බුළුගල ශ්‍රී දන්තපාය රජමහා විහාරස්ථානයේ ටැම්පිට විහාරයේ ගල් උළුවස්ස

ආර්.එම්.එස්.ඩී. රත්නායක[64]

---

අම්බුළුගල රජමහා විහාරයේ ටැම්පිට පිළිමගෙහි පහත මාලයට පිවිසෙන ස්ථානයේ ඇති ගල් උළුවස්ස සුවිශේෂිත වැදගත කලා නිර්මාණයක් වශයෙන් පෙන්වාදිය හැකිය. එහි උස අඩි 10 අඟල් 2 කි. එහි පළල අඩි 8 අඟල් 1 කි. මෙම උළුවස්ස තනි කළු ගලෙන් නිමවා ඇති බව පෙනී ගියත් මෙහි උළුවහු කඳන් දෙකක් එකම කළු ගලෙන් ලබාගෙන ඇති අතර ගල් කොටස් තුනම එකට එක් කොට උළුවස්සක කැටයම් ගත කර ඇත. මෙහි අන්තර්ගත කැටයම් පිළිබඳ ව විමසීමේ දී එහි සෞභාග්‍යයේ සංකේතය වශයෙන් කෝට්ටේ යුගයේ බහුලව යොදාගත් ගජ ලක්ෂ්මී රුව අන්තර්ගත කර ඇත. කෝට්ටේ යුගයේ සාහිත්‍ය, භාෂාව, කලාව, ආර්ථිකය, කෘෂි කර්මාන්තය, ජාත්‍යන්තර සබඳතා, රටේ ඒකීය බව වැනි ලක්ෂණ වලින් අනූන වූ බැවින් සෞභාග්‍යය සංකේතවත් වන මෙම කැටයම් මෙම විහාරයේ තිබුණු බවට උපකල්පනය කළ හැකිය. කෝට්ටේයුගයේ ලී කැටයම් බහුල ව හමු නොවේ.මෙම ගල් උළුවස්ස වූ කලී කෝට්ටේ යුගයේ දැකගත හැකි අපූරුතම දුර්ලභ වූ ගල් කැටයම් නිර්මාණයකි. උළුවස්ස ලීස්තර 10ට බෙදා කැටයම් කර ඇති අතර එක් පැත්තක් අනෙක් පැත්තට සමානය. මෙහි 4,8 යන බොරදම් අතර මනහර ලියවැල්වලින් ද, 4,5,10 ශූන්‍ය තීරු වශයෙන් ද, 7,9 පලාපෙතිවලින් ද, 1,3 අලංකාර මල් වැල්වලින් ද, 6 වැනි ගල් ස්තරය අනෙක් ස්තරවලට වඩා පළල් ව සකසා ඇති අතර එය හතරැස් කොටුවලට බෙදා රංගනයේ යෙදෙන්නන්, බෙර වයන්නන්, හොරණෑ පිඹින්නන්,රබන් වයන්නන් ආදීන් කැටයම් කර ඇත්තේ පෙරහැරක අන්දමට සජීවී බව ඔප් නැංවෙන අයුරිනි, මීට අමතරව ගජ ලක්ෂ්මී රුවට ඉහලින් කිඹිසි මුහුණක් ද පාදාන්තයේ රටා ගත කෙසරු හිස වටේතිබෙන සිංහ රූප දෙකක් ද කැටයම් කර ඇත, ලංකාවේ ඇති අනෙකුත් ගල් උළුවහු සමඟ සසදන කළ අනෙකුත් කිසිම ගල් උළුවස්සක මෙම පෙරහැරක් අන්දමට කැටයමක් විචිත්‍රවත් නොවේ. මෙය මෙම ගල් උළුවස්සට ආවේනික කරුණකි. එම නිසා ම මෙම අම්බුළුගල ගල් උළුවස්ස ඉතා සුවිශේෂි වේ.

ප්‍රමුඛපදඃ ටැම්පිට විහාර, ගල් කැටයම්, ගල් උළුවස්ස.

---

[64] සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, sagarikadilani99@gmail.com.